


# පුස්තකාල ප්‍රවෘත්ති
# நூலகச் செய்திகள்
# LIBRARY NEWS

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

இலங்கைத் தேசிய நூலகத்தின் செய்திப் பிரசுரம்

The Newsletter of the National Library of Sri Lanka


21 වන වෙළුම. 2 කලාපය
2000. අප්‍රේල් - ජූනි
மலர் : 21. இதழ் 2
ஏப்ரல் - யூ ன் 2000
Vol. 21 No. 2
April -June 2000
ISSN 1391-0000



පොත් ප්‍රදර්ශනය විවෘත කිරීම

நூற் கண்காட்சியைத் திறந்து வைத்தல்

Inangeration of the book exhibition, NLDSB
24. 04.2000




ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ 40 වැනි මහා සභා රැස්වීම

இலங்கை நூலக சங்கத்தின் 40 ஆவது ஆண்டுப் பொதுக் கூட்டம

40th Annual General Meeting of Sri Lanka Library Association 28.06.2000



ජාතික පුස්තකාල දසවස් සමරු දේශන මාලාව

தேசிய நூலகத்தின் தசாப்த பூர்த்தி விழாப் பேருரைத் தொடர்

Lecture seriess on 10 anniversary of NLDC
24.04.2000

# පුස්තකාල ප්‍රවෘත්ති

## நூலகச் செய்திகள் LIBRARY NEWS

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

இலங்கைத் தேசிய நூலக, ஆவணவாக்கல் சேவைகள் சபையின் செய்திப் பிரசுரம்

THE NEWSLETTER OF THE NATIONAL LIBRARY AND DOCUMENTATION SERVICES BOARD

ආරම්භය ஆரம்பம் Established 1973

21 වන වෙළුම 2 වන කලාපය
2000 - අප්‍රේල් - ජූනි

සංස්කාරක උපදේශක මණ්ඩලය
**හෙන්රි සමරනායක**
සභාපති

**එම්. එස්.යූ. අමරසිරි**
අධ්‍යක්ෂ ජනරාල්

**ජානකී ප්‍රනාන්දු**
නියෝජ්‍ය අධ්‍යක්ෂ

**ප්‍රධාන සංස්කාරක**
යූ. පී. අලහකෝන්

**සහාය සංස්කාරක**
එච්. ඒ. කේ. ප්‍රේමරත්න

**කවර චිත්‍රණය**
කරුණාසිරි විජේසිංහ

**මුද්‍රණය හා ප්‍රකාශනය**
ප්‍රකාශන අංශය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
නිදහස් මාවත, කොළඹ 07
ශ්‍රී ලංකාව

දුරකථනය : 685196,698847 - 246
ෆැක්ස් : 941 - 685 - 201

කලාපයක මිල රුපියල් 25.00 2.50
වසරක දායක මුදල රුපියල් 100.00
චෙක්පත් හා මුදල් ඇණවුම්පත්

**සභාපති**
**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**
නමට යොමු කරන්න

**කවරය මුද්‍රණය**
සමයවර්ධන ප්‍රින්ටර්ස්

மலர் 21 இதழ் 2
ஏப்ரல் - யூன் 2000

பதிப்பாசிரியர் ஆலோசனைக் குழு
**ஹென்றி சமரநாயக**
தலைவர்

**எம்.எஸ்.யு. அமரசிறி**
நெறியாளர்

**ஜானகி பெர்னாண்டோ**
பதில் உதவி நெறியாளர்

**பிரதம பதிப்பாசிரியர்**
யு.பீ. அழகக்கோன்
**விசேட பதிப்பாசிரியர்**
எச்.ஏ.கே. பிரேமரத்ன

அட்டை வடிவம்
கருணாசிறி விஜயசிங்க

**அச்சிட்டு வெளியிடல்**
வெளியீட்டுப் பிரிவு
சிறீ லங்கா தேசிய நூலகம்
தேசிய நூலக, ஆவணவாக்கல்
சேவைகள் சபை
சுதந்திவழி, கொழும்பு 07
சிறீ லங்கா

தொலைபேசி 685196,698847 - 246
பெக்ஸ் 941-685-201

பிரதியின் விலை ரூபா- 25.00 $ 2.50
ஆண்டுச் சந்தா ரூபா - 100/=
சகல காசோலைகளும், தபால் கட்டளைகளும்

**தலைவர்**
**தேசிய நூலக, ஆவணவாக்கல் சேவைகள் சபையின் பெயருக்கு எழுதப்பட வேண்டும்.**

**அச்சுப் பதிப்பு**
சமயவர்த்தன பிரிண்டர்ஸ்

**Volume 21 No. 2**
April - June 2000

Editorial Advisory Board
**Henry Samaranayake**
Chairman

**M.S.U. Amarasiri**
Director General

**Janaki Fernado**
Deputy Director

**Editor in Chief**
U. P. Alahakoon

**Assit. Editor**
H. A. K. Premaratna

**Cover design**
Karunasiri Wijesinghe

**Printed & Published by**
Publication Division
National Library of Sri Lanka
National Library
& Documentation Services Board
Independence Avenue, Colombo 07.
Sri Lanka.

Tel. 685196, 698847 - 246
Fax : 941 - 685 -201

Price per Copy Rs. 25.00 $ 2.50
Annual Subscription Rs.100
All Cheques and Money Order
should be forwarded to

**Chairman**
**National Library & Documentation Sevices Board**

**Cover Printed by**
Samayawardhana Printers

# පටුන


| | |
|---|---|
| කතුවැකිය | 03 |
| පුවත් | 04 - 06 |
| **செய்திகள்** | 06 - 07 |
| NEWS | 07 - 08 |
| ශ්‍රී ලංකාවේ වාර සඟරා, පුවත්පත්, සම්මන්ත්‍රණ පත්‍රිකා හා රජයේ ප්‍රකාශන පිළිබඳ ග්‍රන්ථ විඥාපන පාලනය<br>ජානකි ප්‍රනාන්දු | 09 - 16 |
| ලේඛන කලාවේ නව අභියෝගය : අධිලේඛන කලාව<br>ධනපාල ගුණසේකර | 17 - 19 |
| **நாட்டின் அபிவிருத்தியில் நூலக தகவல் விஞ்ஞானம்**<br>*எஸ்.எம். கமால்தீன்* | 20 - 23 |
| Developing Service Quality in Libraries<br>Chandima Chiran Jayasundara | 24 - 29 |

කතුවැකිය

# දශකයක ගමන් මඟ

නව සහස්‍රයක අරුනළු සමගින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය සිය දස වන වියට පියමං කරලීය. දශකයක ගමන් මග පිළිබඳ අභිමානය සිත්හි දරා ගෙන එම වකවානුව තුළ ජාතික හා ආයතනික වශයෙන් ඉටු කළ මෙහෙවර විචාරාත්මකව අවලෝකනය කිරීමට මෙය මාහැඟි අවස්ථාවකි. නිරන්තරයෙන් චංචල වන ප්‍රවේගවත් සමාජයක සාමාජිකයන්ගේ අධ්‍යාපනික, බුද්ධිමය, වින්දනාත්මක සහ තොරතුරු අවශ්‍යතා සපුරාලීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය සමත් වී තිබේ ද යන්න මෙහිදී අවධානයට ලක් කළ යුතු කරුණකි. පසුගිය වසර දහය තුළ සිය ආයතනික ව්‍යුහය හා පදනම ශක්තිමත් අයුරින් සකස් කර ගැනීමට ඊට හැකියාවක් ලැබී ඇති බව නොකිවමනාය. එමෙන්ම පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයට අදාළ ජාතික මට්ටමේ ව්‍යාපෘති රැසක් සාර්ථක ලෙස පවත්වා ගෙන යාමට හැකියාවක් ලැබී ඇත.

ශ්‍රී ලාංකීය අධ්‍යයනයන්ට අදාළ ප්‍රශස්ත මට්ටමේ කියවීම් ද්‍රව්‍ය එකතුවක් ගොඩ නැංවීම, ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ඇතුලු නාමාවලි සහ අනුක්‍රමණිකා සම්පාදනය කිරීම, ජාතික ඒකාබද්ධ සූචිය සකස් කිරීම, පුස්තකාල ජාල අතර සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම යනාදිය දෙස බලන විට දේශයේ පුස්තකාල සහ තොරතුරු ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය උදෙසා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ දායකත්වය මනාව දෘෂ්‍යමාන වේ. එමෙන්ම මෙම ක්‍රියාවලිය කාර්යක්ෂමව හා ඵලදායි අයුරින් පවත්වා ගෙන යාම සඳහා නූතන තාක්ෂණික ශක්‍යතාවන් අවශෝෂනය කර ගැනීමට ගන්නා ලද පියවර ද සාධනීය මට්ටමක පවතී.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය මගින් විවිධ විෂයයන්ට අයත් ශ්‍රව්‍ය දෘෂ්‍ය, ඉලෙක්ට්‍රොනික ද්‍රව්‍ය රැසකින් සමන්විත එකතුවන් ගොඩ නංවා තිබුන ද එය පරිහරණය කරන ලබන පාඨක සංඛ්‍යාවේ වර්ධනය සතුටුදායක මට්ටමක නොපැවතීම සුවිශේෂ අවධානයට ලක් කළ යුතු කරුණකි. මීට හේතුව, ජාතික පුස්තකාල එකතුව පිළිබඳ පාඨකයන් නියමාකාරයෙන් දැනුවත් කර නොතිබීම ද නොඑසේ නම් තවමත් මෙරට තුළ ශක්තිමත් පර්යේෂණ සංස්කෘතියක් ගොඩ නැංවී නොතිබීම ද ? යන්න විමසුමට ලක් කළ යුතුය. කෙසේ වෙතත්, වැඩි පාඨක සංඛ්‍යාවක් ජාතික පුස්තකාල එකතුව පරිහරණය කිරීම සඳහා ආකර්ශනය කර ගැනීමට පුළුල් වැඩ පිළිවෙලක් දියත් කිරීමට කාලය එළඹ ඇත. එමගින් ජාතික සංවර්ධන ක්‍රියාවලියට සක්‍රීයව දායක වන තොරතුරු මධ්‍යස්ථානයක් ලෙසින් විශිෂ්ටත්වයට පත්වීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයට හැකියාව ලැබෙනු ඇත.

**සංස්කාරක**

# පුවත්

## ජාතික පුස්තකාල දසවස් සැමරුම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයට වසර දහයක් සපිරීම නිමිත්තෙන් වැඩ සටහන් රැසක් දියත් කරන ලදී.

## පොත් ප්‍රදර්ශනය

2000. 04. 24 සිට 2000. 05. 07 දින දක්වා මෙම ප්‍රදර්ශනය පවත්වන ලදී. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයට අයත් ප්‍රතිග්‍රහණ, ග්‍රන්ථ විඥාපන සේවා, පාඨක සේවා, ප්‍රලේඛන සේවා, සහ සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන යන අංශවල දස වසරක ප්‍රගතිය විදහා දැක්වෙන ඡායාරූප දැක්මකින් සහ පොත් අලෙවියකින් මෙම ප්‍රදර්ශනය සමන්විත විය. එමෙන්ම නව පරපුර තුළ දේශීය සාහිත්‍යය පිළිබඳ ඇති නැඹුරුව වර්ධනය කිරීමේ අරමුණින් ප්‍රවීන ලේඛකයන් හය දෙනෙකුගේ විශාල ප්‍රමාණයේ තෙල් සායම් චිත්‍ර සහ ඔවුන් විසින් රචිත ග්‍රන්ථ රැසක් ද ප්‍රදර්ශනයට එක් කර තිබුණි. පූජ්‍ය හික්කඩුවේ සුමංගල නාහිමි, කුමාරතුංග මුනිදාස, පියදාස සිරිසේන, ඩබ්ලිව්. ඒ. සිල්වා, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර, ආර්. ඒ. ස්පිට්ල් එම ලේඛකයෝ ය.

## සම්මන්ත්‍රණ හා දේශන

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ දස වස් සමරුව වෙනුවෙන් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ හා දේශන පහත සඳහන් පරිදි වේ.

| | දේශනය | දේශක |
|---|---|---|
| 2000. 4. 24 | පුස්තකාලයාධිකාරීත්වය හා පෞරුෂ වර්ධනය | හැරිසන් පෙරේරා මයා සහකාර අධ්‍යක්ෂ (තොරතුරු) බ්‍රිතාන්‍ය කවුන්සලය |
| 2000. 4. 25 | පුනරුප්පත්තිය විද්‍යාත්මකව ඔප්පු කළ හැකිද? | මහාචාර්ය ගැන්විල් ධර්මවර්ධන මයා අධ්‍යක්ෂ, විකිරණශීලි සමස්ථානික මධ්‍යස්ථානය |
| 2000.4. 26 | අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය | ජානකී ප්‍රනාන්දු මෙය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය |
| 2000.4. 27 | පුස්තකාල පරිහරණය හා කියවීමේ රුචිය | අමරා නානායක්කාර මිය පුස්තකාලයාධිපතිනි ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය |

## ප්‍රකාශන

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ දස වස් සමරුව වෙනුවෙන් පහත සඳහන් විශේෂ ප්‍රකාශන නිකුත් කරන ලදී.

* ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය දසවස් සමරුව
* පුස්තකාල ප්‍රවෘත්ති විශේෂ කලාපය

## ජාතික පුස්තකාල දේශන

2000 අප්‍රියෙල් සහ ජුනි මාසවල පවත්වන ලද ජාතික පුස්තකාල දේශන පහත සඳහන් වේ.

| දේශක | දේශනය |
|---|---|
| මහාචාර්ය ගැන්විල් ධර්මවර්ධන මහතා 2000. 04. 25 | පුනරුප්පත්තිය විද්‍යාත්මකව ඔප්පු කළ හැකිද ? |
| ධම්මික කලපුගේ මහතා 2000. 05. 31 | යහපත් ගණුදෙනුකාර සේවාවක් |
| මහාචාර්ය ජේ. කේ. පී. ආරියරත්න මහතා 2000. 06. 28 | ජීවිතයේ අන්තිම යාමය |

## වැඩමුළු

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය මගින් උසස් අධ්‍යාපන හා පර්යේෂණ ආයතනවල පුස්තකාල සඳහා පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය පිළිබඳ එක්දින වැඩමුළුවක් 2000. 06. 06 දින මණ්ඩලීය සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලදී. මෙම වැඩ මුළුවට පාඨමාලාලාභීන් 20 දෙනෙකු සහභාගි විය. එම වැඩමුළුවේ දී පහත සඳහන් මාතෘකා යටතේ දේශන පවත්වන ලදී.

| මාතෘකාව | දේශක |
|---|---|
| 1. පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය හා ප්‍රතිෂ්ඨාපනය හැඳින්වීමක් | එම්. එස්. යූ. අමරසිරි මහතා අධ්‍යක්ෂ ජනරාල් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය |
| 2. පුස්තකාලයක සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශයක් සංවිධානය කිරීම | එස්. එම්. අබේරත්න මහතා ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති කැළණිය විශ්ව විද්‍යාලය |

| | |
|---|---|
| 3. පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය කිරීම සඳහා ජාතික පුස්තකාලය ගනු ලබන පියවර | ජසින්තා සෙනෙවිරත්න මිය. සහකාර පුස්තකාලයාධිපතිනි ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය |
| 4. පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණයේ දී අවධානය යොමු කළ යුතු විද්‍යාත්මක කරුණු | ආචාර්ය සරෝජා වෙත්තසිංහ මිය සහකාර ලේඛණාරක්ෂ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව |
| 5. පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය සඳහා නව තාක්ෂණය යොදා ගැනීම | අමරා නානායක්කාර මිය පුස්තකාලයාධිපති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය |
| 6. පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය සැලසුම් කිරීම | ආචාර්ය නයනී මැලගොඩ මිය කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය |

## පුහුණු පාඨමාලා

2000 අප්‍රියෙල් - ජූනි කාලය තුළ පහත සඳහන් පුහුණු පාඨමාලා පවත්වන ලදී.

* දකුණු පළාතේ මහජන පුස්තකාලයාධිපතීන් සඳහා පරිගණක පුහුණු පාඨමාලාවක් 2000 . 05 . 27, 2000 . 06 . 07 සහ 2000. 06. 24 දිනයන්හි දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ දී පවත්වන ලදී.

* 2000. 06. 24 සහ 27 දක්වා දකුණු පළාතේ මහජන පුස්තකාලයාධිපතීන් පුහුණු කිරීමේ පාඨමාලාවක් දික්වැල්ල ග්‍රාම සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී. ඒ සඳහා පාඨමාලාලාභීන් 58 දෙනෙකු සහභාගි විය.

## ග්‍රන්ථ ප්‍රකාශන ආධාර

2000 අප්‍රේල්, මැයි, ජූනි, කාලය තුළ පොත් ප්‍රකාශන ආධාර වැඩපිළිවෙල යටතේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සමග ගිවිසුම් අත්සන් කරන ලද කර්තෘවරුන් හා ග්‍රන්ථ පහත දැක්වේ.

| කර්තෘ | ග්‍රන්ථ නාමය |
|---|---|
| 1. මහා. බන්දුසේන ගුණසේකර | ඓතිහාසික ජනශ්‍රැති |
| 2. Wilfred Jayasuriya | Christines Story |
| 3. බන්දුල අබේසේකර | ඒ විල්පත් නැතිව ගියේ |
| 4. කුමුදු කිත්සිරිමෙවන් දොඩන්තැන්න | අරුන්දතී |
| 5. කිත්සිරි කොතලාවල | කටුසර වරුණ |
| 6. උත්පලා හේමන්ති | අවාරය |
| 7. M.S.F. Hassan | Cricket Ulahil Prahesithha Warahal |
| 8. Vijaya Niranjan | Executive Presidency the Sri Lanka Dilemma |
| 9. ෆැන්සිස් බුලත්සිංහල | බුලත හා බැඳුණු පෙම් සිතිවිලි |
| 10. චන්දන මෙන්ඩිස් | නිල් දියමන්ති අභිරහස |
| 11. වසන්ත අභයකුමාර දිසානායක | සඳ කළුවරේ |
| 12. පියසිරි අමල සිත් යාපා | කැඳට උපන් තුරුලතා |
| 13. A. A. Junaideen | Thaierum thierupfar |
| 14. එඩ්මන් සෝමපාල | අධ්‍යාපන චාරිකා මග |
| 15. ජේ. කේ. කුමාරදාස | දෙවියන් දුටු මිනිසා |
| 16. ජී. ඩබ්. ජයන්ත අරවින්ද | සරල ගී රසාස්වාදනය |
| 17. කේ. ඒ. සුමිත් ධර්ම ශ්‍රී | ශ්‍රී ලංකාවේ අනුරාධපුර යුගයේ උද්‍යාන නිර්මාණ කලාව |
| 18. එච්. එම්. එස්. තුන්දෙනිය | හෙළ ජනකතා |
| 19. ස්ටැන්ලි අමුණුගම | The Twins and some other tales from Sri Lanka. |
| 20. යසවර්ධන රුද්‍රිගු | කථා ගැන කථා |
| 21. කේ. ඒ. කාන්ති පද්මා තෙන්නකෝන් | මින්නේරි පුරාණ දේවාලය |

## ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ මහා සභා රැස්වීම

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ 40 වැනි මහා සභා රැස්වීම 2000 ජූනි මස 28 දින පවත්වන ලදී. එහිදී ඉදිරි වසර සඳහා පත් කරන ලද නිලධාරී මණ්ඩලය පහත දැක්වේ.

සභාපති - දයා රත්නායක මිය. ලේකම් - ස්වර්ණා ජයතිලක මිය, උප සභාපති - දීපාලි තලගල මිය, අමරා නානායක්කාර මිය, භාණ්ඩාගාරික - ඇන්ටන් නල්ලතම්බි මයා, අධ්‍යාපන නිලධාරී- ප්‍රදීපා විජේතුංග මිය ප්‍රකාශන නිලධාරී - ඒ. පී. ආර්. ගමගේ මිය. සහකාර අධ්‍යාපන නිලධාරී - ජී. ආර්. පද්මසිරි මයා, සහකාර ලේකම්- ශිවන්ති වීරසිංහ මිය.

# செய்திகள்

## தேசிய நூலகத்தின் தசாப்த நிறைவு விழா

தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலையத்தின் தசாப்த நிறைவு விழாவையொட்டி பல நிகழ்ச்சிகள் ஒழுங்குபடுத்தப்பட்டிருந்தன

### நூற் கண்காட்சி :

இக் கண்காட்சி 2000.04.24 ஆம் திகதி தொடக்கம் 2000.05.07 ஆம் திகதி வரை நடைபெற்றது. தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலையத்தின் நூலீட்டற் பிரிவு, நூற் பட்டியலாக்கச் சேவைப் பிரிவு, வாசகர் சேவைப் பிரிவு, ஆவணவாக்கற் சேவைப் பிரிவு, பேணல் புதுப்பித்தல் பிரிவு போன்றவற்றின் பத்தாண்டு கால அபிவிருத்தியை வெளிக் காட்டும் புகைப்படக் கண்காட்சியையும், நூல் விற்பனைக் கூடத்தையும் இக் கண்காட்சி கொண்டிருந்தது. அதேபோல புதிய பரம்பரை யினரிடம் தேசிய இலக்கியங்கள் தொடர்பாக உள்ள நாட்டத்தை அபிவிருத்தி செய்யும் நோக்குடன் ஆறு பிரபல எழுத்தாளர்களின் பெரியளவிலான எண்ணைச் சித்திரங்களும், அவர்களால் எழுதப்பட்ட பல நூல்களும் சேகரித்து காட்சிக்கு வைக்கப்பட்டிருந்தன. வணக்கத்திற்குரிய ஹிக்கடுவ சுமங்கல தேரர், குமாரதுங்க முனிதாச, திரு. பியதாச சிறிசேன, திரு. டபிள்யு.ஏ. சில்வா, பேராசிரியர் எதிரிவீர சரச்சந்திர, திரு. ஆர்.ஏ. ஸ்பிறறல் ஆகியோரே அவ் எழுத்தாளர்களாவர்.

### மாநாடுகளும் பேருரைகளும் :

தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலை யத்தின் தசாப்த நிறைவு விழாவை முன்னிட்டு நான்கு பேருரைகள் ஒழுங்கு செய்யப்பட்டிருந் தன. இப் பேருரைகள் பிரித்தானிய கவுன்சிலின் உதவி பணிப்பாளர் திரு. ஹரிசன் பெரேரா, பேராசிரியர் திரு. இரன்வில் தர்மவர்த்தன, தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலை யத்தின் பிரதிப் பணிப்பாளர் செல்வி ஜானகி பொ்னான்டோ, தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலையத்தின் நூலகர் திருமதி. அமரா நாணயக்கார என்பவரால் நடத்தப்பட்டது.

### வெளியீடுகள் :

தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலையத்தின் தசாப்த நிறைவு விழாவின் நிமித்தம் கீழ்க் குறிப்பிடப்பட்டுள்ள இரு விசேட வெளியீடுகள் வெளியிட்டு வைக்கப்பட்டன.

- தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலையத்தின் பத்தாண்டு நிறைவு விழா மலர்
- நூலகச் செய்தியின் விசேட தொகுதி

## தேசிய நூலகப் பேருரைத் தொடர்

2000 ஏப்ரல் - யூன் மாதங்களில் நடத்தப்பட்ட தேசிய நூலகப் பேருரைத் தொடரில் கீழ்க் குறிப்பிடப்பட்டுள்ள பேருரைகள் நடத்தப்பட்டன. பயிற்சிப் பட்டறைகள்

| விரிவுரையாளர் | விரிவுரைகள் |
|---|---|
| பேராசிரியர் திரு. கிரண்வில் தர்மவர்த்தன | - மறுபிறப்பை விஞ்ஞான ரீதியில் நிரூபித்தல் |
| திரு. . தம்மிக்க | - சாதகமான கொடுக்கல் கலபுகே வாங்கல் சேவைகள் |
| பேராசிரியர் திரு. | - வாழ்வின் முடிவை ஜே.கே.பீ. ஆரியரத்ன நோக்கி |

## பயிற்சிப் பட்டறைகள்

தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலையத்தின் பேணல் மீளமைத்தல் பிரிவினால் உயர் கல்வி மற்றும் ஆராய்ச்சி நிறுவனத்தின் நூலகங்களின் பொருட்டு நூலக சாதனங்களை பேணுதல் தொடர்பான ஒரு நாள் பயிற்சிப் பட்டறை ஒன்று 2000.06.06 திகதி சபையின் கேட்போர்

கூடத்தில் நடத்தப்பட்டது. இப் பயிற்சிப் பட்டறையில் 20 பயிற்சியாளர்கள் பங்குபற்றினர்.

## பயிற்சிப் பாடநெறி

2000 ஏப்ரல் - யூன் காலப்பகுதியில் கீழ்க் காட்டப்பட்டுள்ள பயிற்சிப் பாடநெறிகள் நடைபெற்றன.

• தென்மாகாணத்தின் பொது நூலகர் களின் பொருட்டு கணனிப் பயிற்சிப் பாடநெறிகள் 2000.05.27, 2000.06.07, 2000.06.24 ஆம் திகதிகளில் தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையில் நடைபெற்றது.

• 2000.06.24-27 வரை தென்மாகாண பொது நூலகர்களைப் பயிற்றுவிக்கும் பாடநெறி ஒன்று திக்வெல்ல கிராமிய அபிவிருத்தி பயிற்சி நிலையத்தில் நடத்தப்பட்டது. அப் பயிற்சி நெறியில் 58 பயிற்சியாளர்கள் பங்குபற்றினர்.

## இலங்கை நூலக சங்கத்தின் ஆண்டுப் பொதுக் கூட்டம்

இலங்கை நூலக சங்கத்தின் 40 ஆவது ஆண்டுப் பொதுக்கூட்டமானது 2000 யூன் மாதம் 28 ஆம் திகதி நடைபெற்றது. அங்கு எதிர்வரும் ஆண்டுக்காக நியமனம் செய்யப்பட்ட அலுவலர் குழாம் கீழ்க் காட்டப்பட்டுள்ள வாறாகும்.

தலைவர் - திருமதி. தயா ரத்நாயக்க, செயலாளர் - திருமதி. சுவர்ணா ஜயத்திலக, உப தலைவாகள் - திருமதி தீபாளி தலகல்ல, திருமதி அமரா நாணயக்கார, பொருளாளர் - அன்ரன் நல்லதம்பி, கல்வி அதிகாரி - திருமதி பிரதீபா விஜயதுங்க, வெளியீட்டு அலுவலர் - திருமதி. ஏ.பீ.ஆர் கமகே, உதவி கல்வி அதிகாரி - திரு. ஜீ.ஆர். பத்மசிறீ, உதவிச் செயலாளர் - திருமதி. சிவந்தி வீரசிங்க

# NEWS

## Tenth Anniversary of the National Library and Documentation Centre

NLDC conducted serveral programmes to commomorate its 10th anniversary.

## Book Exhibition

The book exhibition was held from 24.04.2000 to 07. 05. 2000 at the NLDSB premises, depicting information on acquistions, readers services, bibliographic services, documentation services, and conservation & restoration divisions during the past decade. It included photographs as well and a book sale. To promote the awareness of indigenous literature among younger generation, it also included exhibition of oil paintings at six well known writers and the books written by them. They are, Ven Hikkaduwe Sumangala thero, Cumaratunga Munidasa, Piyadasa Sirisena, W. A. Silva, Prof. E.R. Sarathchandra and R. L. Spittle

## Seminars and lectures

NLDC organized a lecture series to mark its 10th annversary as follows.

| Date | Lecturer | Lecture |
| --- | --- | --- |
| 24.04.2000 | Mr.Harisson Perera<br>Asst. Director<br>(Information)<br>British Council | පුස්තකාලයා<br>ධිකාරීත්වය<br>හා පෞරුෂ<br>වර්ධනය |
| 25.04.2000 | Prof. Granville<br>Dharmawardhana<br>Director, Isotope<br>Centre<br>University of<br>Colombo | පුනරුප්පත්තිය<br>විද්‍යාත්මකව<br>ඔප්පු කළ<br>හැකිද? |
| 26.04.2000 | Miss Janaki<br>Fernando<br>Deputy Director<br>NLDC | අන්තර්ජාතික<br>ප්‍රමිති ග්‍රන්ථ<br>අංක<br>ව්‍යාපෘතිය |
| 27.04.2000 | Mrs. Amara<br>Nanayakkara<br>Librarian<br>NLDC | පුස්තකාල<br>පරිහරණය<br>හා<br>කියවීමේ<br>රුචිය |

## Publications

NLDC issued two special publications to commomerate the 10th anniversary.

1. National Library and Documentation Centre 10th anniversary
2. Library News special volume.

## National Library Lecture series

Under the National Library Lecuture series the lectures conducted during April - June 2000 are given below

| Lecturer | Lecture |
|---|---|
| Prof. Granville Dharmavardhana 25.04.2000 | පුනරුප්පත්තිය විද්‍යාත්මකව ඔප්පු කළ හැකි ද? |
| Mr. Dhammika Kalapuge 31.05.2000 | යහපත් ගණුදෙනුකාර සේවාවක් |
| Prof. J.K.P. Ariyaratne 28.06.2000 | ජීවිතයේ අන්තිම යාමය |

## Workshop

Conservation and Preservation division of the NLDC conducted a workshop on conservation and preservation of library materials for librarians from higher education and research institutes on 06th June 2000. Twenty participants participated at this workshop.

## Training Programmes

The NLDSB conducted the following training programmes for the benefit of Public Librarians.

* Training Programme on library automation for public librarians in Southern province was held in 27. 05. 2000, 07. 06 2000 and 24. 06. 2000 at the NLDC.

* Training programme for public librarians in Southern province was held at the Rural Development Training Centre, Dikwella from 24 - 27 June 2000.

## SLLA New Office Bearers

Following persons have been elected as new office bearers of the Sri Lanka Library Association for the Year 2000. President - Ms Daya Ratnayaka, General Secretary - Ms Swarna Jayatillaka, Vice President - Ms Deepali Talagala, Ms Amara Nanayakkara, Treasurer - Mr. Anton Nallathamby, Education Officer - Ms Pradeepa Wijetunga, Publication Officer - Ms A. P. R. Gamage, Asst Education officer - Mr. G. R. Padmasiri, Asst. Secretary - Ms Shiwanthi Weerasinghe

## Book Donation

The Library and Information Centre of the Central Bank of Sri Lanka is in the process of rebuilding its collection with printed and electronic sources. Mr. H. B. Dissanayaka, Ex - Governer, handed over a book donation to the Library on 10th May 2000. Mr. A. S. Jayawardhana Governer, Central Bank, Mrs Nalini de Silva Wijenayaka, the Chief Librarian and Mr. P. Amerasinghe, Deputy Governer were also at the ceromony.


අඩසියවසක් තුළ සිංහලයට පරිවර්තිත
විශ්ව සාහිත්‍ය කෘති හඳුනා ගන්න

**සිංහල පරිවර්තන සාහිත්‍ය**
**ග්‍රන්ථ නාමාවලිය**
**1947 - 1997**

කර්තෘ, ග්‍රන්ථ නාම, පරිවර්තන සහ පරිවර්තන ග්‍රන්ථ නාම අනුක්‍රමණිකා ඇතුළත් ය.

මිල රු. 130/-

**විමසීම්**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා
මධ්‍යස්ථානය
14, නිදහස් මාවත, කොළඹ 07.

# ශ්‍රී ලංකාවේ වාරසඟරා, පුවත්පත්, සම්මන්ත්‍රණ පත්‍රිකා සහ රජයේ ප්‍රකාශන පිළිබඳ ග්‍රන්ථ විඥාපන පාලනය


ජානකී ප්‍රනාන්දු
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය


## හැඳින්වීම

කිසියම් රටක ප්‍රකාශයට පත්වන ප්‍රකාශන මුද්‍රිත (Printed), ශ්‍රව්‍ය දෘශ්‍ය (Audio - visual) , සහ විද්‍යුත් (Electronic) මාධ්‍ය යනුවෙන් ප්‍රධාන කොටස් තුනකට බෙදා දැක්වීමට පුළුවන. වාරසඟරා (Periodicals), පුවත්පත් (Newspapers), සම් මන්ත්‍රණ පත්‍රිකා (Conference Papers), සහ රජයේ ප්‍රකාශන (Government Publications) සාමාන්‍ය යෙන් මුද්‍රිත මාධ්‍යයේ ප්‍රකාශන ලෙස ගැනේ. එසේ වුව ද, වාර සඟරා විද්‍යුත් මාධ්‍ය ප්‍රකාශන ලෙස ද, ප්‍රකාශයට පත්වන අවස්ථා දක්නට ඇත. මුල් පිටපත මුද්‍රිත මාධ්‍ය ප්‍රකාශනයක් ලෙස ප්‍රකාශයට පත්ව ඇතත්, සංරක්ෂණය සහ ගබඩාකරණය යන කාර්යයන්හි දී පුස්තකාල විසින් පුවත්පත්වල මුල්පිටපත මගින් සූක්ෂම සේයා පට (Microfilms) වශයෙන් සහ පොත්, රජයේ ප්‍රකාශන ආදියෙහි මුල් පිටපත මගින් සූක්ෂම කාඩ් පත්‍රිකා (Microfiche) ස්වරූපයෙන් පිටපත් සකසා ගැනීම දක්නට ලැබෙන්නකි.

විෂයයන්ගේ පුළුල්වීම හේතුවෙන් නව විෂයයන් බිහිවීම; අධ්‍යාපනයේ දියුණුව හේතුකොටගෙන උගතුන්ගේ වැඩිවීම සහ ඒ නිසා පොත්පත් ලියන පිරිසගේ වැඩිවීමක් ඇතිවීම; පර්යේෂණ ආයතන, විවිධ ක්ෂේත්‍රයන්හි විද්වත් වෘත්තීය සංගම්, තනි පුද්ගලයන් ආදී වශයෙන් පර්යේෂණයන්හි යෙදීම; විවිධ ස්වරූපයෙන් ප්‍රකාශන බිහිවීම (පොත්පත්, වාරසඟරා පුවත්පත්, වාර්තා, සම්මන්ත්‍රණ පත්‍රිකා, රජයේ ප්‍රකාශන ආදී වශයෙන්); මුද්‍රණ ශිල්පය නව තාක්ෂණය අනුව දියුණුවීම නිසා ඉක්මණින් ප්‍රකාශන මුද්‍රණය කිරීමට හැකි වී තිබීම යනාදී කරුණු නිසා ප්‍රකාශන ක්ෂේත්‍රයේ සංකීර්ණ බවක් ඇතිවිණි. මෙලෙස අධිවේගී ස්වරූපයෙන් ප්‍රකාශන පළවීම නිසා පළ වී ඇති ප්‍රකාශන මොනවා ද ? ඒවා කුමන විෂයන්ට අයත් ද? , ඒවායේ කර්තෘවරුන් කවරෙක් ද?, ග්‍රන්ථ නාම මොනවා ද? ප්‍රකාශන වර්ෂය, ප්‍රකාශක කවුරුන් ද? යනාදී ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කළ යුතු බව පුස්තකාලයාධිපතීන්, ප්‍රලේඛන නිලධාරීන්, විඥාපන විශේෂඥයන්, විෂය විශේෂඥයන් යන අය හට වැටහිණි. ශ්‍රී ලංකාවේ විවිධ ස්වරූපයෙන් ප්‍රකාශයට පත්වන ප්‍රකාශන පිළිබඳ තොරතුරු පර්යේෂකයන් මෙන්ම අනිකුත් සියලුම පාඨකයන්ට ද පහසුවෙන් දැනගැනීමට මෙන් ම එම ප්‍රකාශන කරා ඉක්මණින් ප්‍රවේශ වීමට ද කිසියම් සංවිධානාත්මක ආකාරයකින් ඉදිරිපත් කළයුතු වේ. මෙලෙස ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය ලෙස හැඳින්වේ.

## ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ විඥාපන පාලනයේ ඓතිහාසික පසුබිම

ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ විඥාපන පාලනයේ ඓතිහාසික පසුබිම ගැන බැලීමෙහිදී පෙනී යනුයේ ග්‍රන්ථ විඥාපන පාලනය හා අදාළව වැදගත් පියවර කිහිපයක් ගෙන ඇති බවයි.

* 1839 අංක 5 දරණ ප්‍රවෘත්ති පත්‍ර පිළිබඳ ආඥාපනත අනුව මුද්‍රණය කරනු ලබන සෑම පුවත්පතක ම එක් පිටපතක් මුද්‍රණකරුගේ හෝ ප්‍රකාශකගේ අත්සන සහිතව ලියාපදිංචි ය සඳහා එවිය යුතු අතර, ඊට අමතරව අත්සන් රහිත අතිරේක පිටපතක් ද සැපයිය යුතු වේ. එවකට මුද්‍රණද්වාරයෙන් නිකුත් කෙරුන පුවත්පත් කවුරුන් විසින් ප්‍රසිද්ධ කරනු ලබන්නේ ද යන්න දැනගැනීම පිණිසත් එම පුවත්පත්හි සත්‍ය පිටපත් ලබාගැනීම සඳහාත් පුවත්පත් ලියාපදිංචි කළයුතු බවත්, ඒ සඳහා නීති සම්පාදනය කිරීමේ වැදගත්කමත් පෙනීයාමෙන් 1839 අංක 5 දරණ ප්‍රවෘත්ති පත්‍ර පිළිබඳ පනත සම්මත කරන ලදී. 1840 පෙබරවාරි 01 වැනි දින සිට මෙම පනත දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලැබීය. 1839 දී සම්මත වූ එම පනත 1951 සිට ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂකගේ අධීක්ෂණ ය යටතේ සංශෝධන සහිතව දැනට ලංකාණ්ඩුවේ ආඥා පනතේ 180 වැනි අධිකාරය ලෙස ක්‍රියාත්මක වේ. මුලදී

බ්‍රිතාන්‍ය යටත් විජිත ලේකම්වරයා වෙත යවන ලද අත්සන සහිත පුවත්පත් පිටපත් ඉන්පසු ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ පොත්පත් හා පුවත්පත් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත යැවීම සිදුවිණි. 1940 සිට අද දක්වා ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කරන ලද සෑම පුවත්පතක ම අත්සන සහිත පිටපතක් නීතිමය තැන්පතුව ලෙස ජාතික ලේඛනාරක්ෂක දෙපාර්ත මේන්තුවෙ හි තැන්පත් වී තිබේ. මෙම පනතෙහි " To regulate the printing and publishing of newspapers in this colony" යනුවෙන් සඳහන් වීමෙන් පෙනී යනුයේ වක්‍ර අයුරින් හෝ ග්‍රන්ථ විඥාපන පාලනයක් සිදු වී ඇති බවයි.

මෙම ආඥාපනතෙහි 1976 අංක 5 දරණ නීතිය මගින් කරන ලද සංශෝධනයකට අනුව 1976 සැප්තැම්බර් මස සිට අත්සන රහිතව ලැබෙන පුවත්පතෙහි පිටපත් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වෙත තැන්පතු පිටපත් වශයෙන් ලැබීම සිදුවෙමින් පවතී.

* රජයේ පාලන හා සංඛ්‍යාත්මක කරුණු එක්රැස් කොට පළ කරනු ලැබූ CEYLON BLUE BOOK යන ප්‍රකාශනයෙහි 1962 සිට එකල ලංකාවේ පළාත් අනුව ප්‍රකාශයට පත්ව˜තිබූ පොත්, වාරසඟරා, පුවත්පත් ආදිය පිළිබඳව ලැයිස්තුවක් සහ ඒවායේ පිටපත් සංඛ්‍යාව පිළිබඳව ද විස්තර පළකර තිබීම මෙරට ග්‍රන්ථ විඥාපන පාලනයේ වැදගත් පියවරක් ලෙස සඳහන් කිරීමට පුළුවන.

* 1885 අංක 1 දරණ මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයන්ගේ ආඥාපනත අනුව ලංකාවේ ප්‍රකාශයට පත් කරනු ලබන සියලුම ප්‍රකාශන ලියාපදිංචි කිරීමට කටයුතු යෙදීම සිදුවින. මෙම පනතෙහි ශීර්ෂය වූයේ "ලංකාවේ මුද්‍රණය කරනු ලබන පොත්වල පිටපත් ආරක්ෂා කරගැනීම හා එම පොත් ලියාපදිංචි" සඳහා වූ පනතක් යනුවෙනි. 1885 අප්‍රේල් 01 වැනි දින සිට මෙම පනත දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලැබීය. මෙම පනත ද 1951 සිට ජාතික ලේඛනාගාර අධක්ෂකගේ අධීක්ෂණය යටතේ දැනට ලංකාණ්ඩුවේ ආඥා පනතේ 179 වැනි අධිකාරිය ලෙස ක්‍රියාත්මක වේ. 1885 සිට ලංකාවේ ප්‍රකාශයට පත්කරනු ලැබූ සෑම ප්‍රකාශනයකින් ම නීතිමය තැන්පතු පිටපත වශයෙන් එක් පිටපතක් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත්ව ඇත. මීට අමතරව රජය විසින් නම් කරනු ලැබූ පහත සඳහන් ආයතනවල පිටපතක් බැගින් තැන්පත් කිරීමට 1885 ආඥාපනත මගින් විධිවිධාන සලසා ඇත.

* ජාතික කෞතුකාගාර පුස්තකාලය (1885 සිට මේ දක්වා)

* එක්සත් රාජධානියේ බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලය (1885 සිට 1989 මුල්භාගය දක්වා පමණි)

* පේරාදෙණිය විශ්වවිද්‍යාල පුස්තකාලය (1952 සිට මේ දක්වා)

* ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය (1976 සිට මේ දක්වා)

මේ අයුරින් වර්තමානයේ ප්‍රකාශයට පත්වන සෑම ප්‍රකාශන යකින් ම පිටපත් 05ක් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්ත මේන්තුවේ ලියාපදිංචිය සඳහා ලබාදීමට මුද්‍රණකරු නීතියෙන් බැඳී සිටී. මෙයද ග්‍රන්ථ විඥාපන පාලනයේ වැදගත් පියවරක් ලෙස සඳහන් කිරීමට පුළුවන.

* 1862 සිට 1884 දක්වා Ceylon Blue Book හි පළකරනු ලැබූ ප්‍රකාශයට පත් කරනු ලැබූ පොත්පත් පිළිබඳ විස්තර වෙනුවට 1885 ආඥාපනතෙහි දැක්වෙන පරිදි ලංකාණ්ඩුවෙහි ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කිරීමට ආරම්භ වුණි. 1885 අංක 1 දරණ මුද්‍රණ කරුවන්ගේ හා ප්‍රකාශකය න්ගේ ආඥාපනත අනුව නීතිමය තැන්පතුව යටතේ ලියාපදිංචි කරන සියලුම පොත්පත් පිළිබඳව "ලංකාවේ මුද්‍රිත ග්‍රන්ථ පිළිබඳ නාමාවලිය" නමින් ප්‍රකාශනයක් සම්පාදනය කොට ත්‍රෛමාසිකව රජයේ ගැසට් පත්‍රයෙහි කොටසක් ලෙස පළ කිරීම නීතිමය අවශ්‍යතාවක් වුණි. 1885 සිට මේ දක්වා ලියාපදිංචි කරනු ලැබූ පොත්පත් හා වාර සඟරාවල විස්තර ඇතුළත් ලැයිස්තුවක් ත්‍රෛමාසිකව ගැසට් පත්‍රයෙහි පළකිරීම සිදුවේ. මීට ඉහත දී සඳහන් කරනු ලැබූ මූලාශ්‍රයන්ට වඩා විස්තරාත්මකව ග්‍රන්ථ විඥානාත්මක තොරතුරු ඇතුළත් කිරීම ගැසට් පත්‍රයෙහි V වන කොටසින් සිදු වී ඇත. [ Part v - Quarterly Statment of Books - Printed in Sri Lanka and Registered under the Printers and Publishers Ordinance (chap 179) මෙම ත්‍රෛමාසික ලැයිස්තුව පිළියෙල කරනුයේ පොත්පත් සහ පුවත්පත් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කිරීම සඳහා ලැබෙන පොත්පත් පිළිබඳ තොරතුරු ආශ්‍රයෙන් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්ත මේන්තුව විසිනි. ශ්‍රී ලංකාවේ මුද්‍රණය වන ලියාපදිංචි කරනු ලබන සෑම ප්‍රකාශනයක් පිළිබඳව ම මුද්‍රණ කරුවන්ගෙන් හා ප්‍රකාශකයන් ගෙන් ලබාගන්නා තොරතුරු කරුණු 16ක් පදනම් කර ගනිමින් මෙම ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ. මෙම ප්‍රකාශනයෙහි පොතෙහි ලියාපදිංචි අංකය, ග්‍රන්ථනාමය, ග්‍රන්ථය ලියා ඇති භාෂාව, කර්තෘ, පරිවර්තක හෝ සංස්කාරකගේ නම, විෂය, මුද්‍රණය කළ ස්ථානය, ප්‍රකාශන ස්ථානය, මුද්‍රණකරුගේ හෝ මුද්‍රණාලයේ නම, ප්‍රකාශකගේ හෝ ප්‍රකාශන ආයතනයේ නම, පිටපත් සංඛ්‍යාව, මුද්‍රණයේ ස්වරූපය, මිල, ප්‍රකාශන හිමිකම හෝ ප්‍රකාශන හිමිකමක කොටසක අයිතිකරුගේ නම හා

ලිපිනය යනාදි විස්තර එක් ලැයිස්තුවෙහි ඇතුළත් කර තිබෙන හෙයින් එවකට පැවති ග්‍රන්ථ විඥාපන පාලනය සම්බන්ධයෙන් වැදගත් වූ මූලාශ්‍රයක් වශයෙන් සඳහන් කිරීමට පුළුවන. ග්‍රන්ථ විඥාපන පාලනයෙහි තවත් වැදගත් පියවරක් ලෙස මෙය සඳහන් කළ හැක. 1885 සිට විටින් විට සංශෝධනයන්ට භාජනය වෙමින් මෙම ත්‍රෛමාසික ප්‍රකාශනය ප්‍රකාශයට පත් වූ අතර, 1963 දී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය ප්‍රකාශයට පත්වන තුරු දේශීය ග්‍රන්ථ පිළිබඳව තිබූ එකම සාධිකාරී ලේඛනය මෙය වේ.

## නීතිමය තැන්පතු ක්‍රමයේ ප්‍රධාන පරමාර්ථ

අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය (IFLA - International Federation of Library Associations and Institutions) යටතේ ඇති විශ්ව ග්‍රන්ථ විඥාපන පාලන (UBC - Universal Bibliographic Control) අංශය විසින් නීතිමය තැන්පතු ක්‍රමයේ ප්‍රධාන පරමාර්ථ ලෙස පහත සඳහන් පරමාර්ථ දක්වා ඇත.

1. ජාතියේ ප්‍රකාශන එක්රැස් කිරීම හා ආරක්ෂා කිරීම
2. ජාතික ප්‍රකාශන සම්බන්ධයෙන් ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීම

ශ්‍රී ලංකාවේ නීතිමය තැන්පතු නීතිය මගින් මෙරට විවිධ මාධ්‍යයෙන් ප්‍රකාශයට පත්වන සියලුම ප්‍රකාශන ආවරණය නොවේ. මුද්‍රිත මාධ්‍ය ප්‍රකාශන හැරුණු විට ශ්‍රව්‍ය දෘශ්‍ය හා විද්‍යුත් මාධ්‍ය ප්‍රකාශන ආවරණය වීමක් සිදු නොවේ. මේ නිසා දේශීය ප්‍රකාශන මුළුමනින් ම ආවරණය වීමක් සිදුනොවන බව කීමට පුළුවන. එහෙත් කිසියම් ප්‍රමාණයකින් හෝ ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීමට නීතිමය තැන්පතු ක්‍රමය ඉවහල් වී ඇති බව කිව හැකිය.

## ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය

ග්‍රන්ථ විඥාපන පාලනය යන්නට විවිධ නිර්වචන දක්වා ඇතත්, ඒ හැම නිර්වචනයකටම ඇතුළත්ව ඇති අදහස වනුයේ ලිඛිත, මුද්‍රිත, ශ්‍රව්‍ය - දෘශ්‍ය, විද්‍යුත් යන කුමන මාධ්‍යයේ වුවද, ප්‍රකාශිත හෝ අප්‍රකාශිත වාර්තාගත දැනුම පිළිබඳව ප්‍රමාණවත් අයුරින් වාර්තාගත කිරීමේ ක්‍රමයක් ඇතිකිරීම හා පවත්වාගෙන යාමයි, කාර්යක්ෂම ප්‍රගතියක් සඳහා වාර්තාගත දැනුමින් වැඩි ප්‍රයෝජන ලබාගැනීමට ග්‍රන්ථ විඥාපන පාලනයක් අත්‍යවශ්‍ය බව පෙන්වා දී ඇත. ජාතික ග්‍රන්ථ විඥාපන පාලනයෙහිදී කිසියම් රටක ජාතියේ සියලුම සාහිත්‍ය පිළිබඳ තොරතුරු වාර්තාගත කිරීම සිදුවේ. මෙහිදී රට තුළ ප්‍රකාශයට පත් වූ මෙන් ම අප්‍රකාශිත සාහිත්‍ය පිළිබඳව තොරතුරු වාර්තාගත කිරීම සිදුවන අතර, ඊට අමතරව, එම රටෙහි පුද්ගලයන් විසින් වෙනත් රටවල දී ලියා පළකරනු ලැබූ ප්‍රකාශන ද, මේ පිළිබඳ ලොව කොතැනක හෝ පළ වී ඇති ප්‍රකාශන පිළිබඳව ද වාර්තාගත කිරීම සිදුවේ.

ජාතික ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීම මෙන් ම ග්‍රන්ථ විඥාපන පාලනය සම්බන්ධයෙන් වගකීම් පැවරී ඇති වෙනත් රජයේ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, තනි පුද්ගලයන් මූලිකත්වයක් ගෙන කටයුතු කිරීම බොහෝ රටවල දක්නට ලැබෙන ලක්ෂණයකි. එමෙන්ම ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීමට කටයුතු කිරීමේ දී ඔවුන් විවිධ ආකාරයෙන් දායක වී ඇති අතර, ඒනිසා විවිධ සේවාවන් ද ඇතිවින.

ග්‍රන්ථ නාමාවලි සම්පාදනය, අනුක්‍රමණිකා සම්පාදනය, සාර සංග්‍රහ සම්පාදනය, ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය, ඒකාබද්ධ සූචි සම්පාදනය, ඒකාබද්ධ ලැයිස්තු සම්පාදනය, ග්‍රන්ථ නාමාවලී පිළිබඳ ග්‍රන්ථ නාමාවලී සම්පාදනය, පරිගණක ග්‍රන්ථ විඥාපන පාලනය සම්බන්ධයෙන් වගකීම් පැවරී ඇති වෙනත් රජයේ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, තනි පුද්ගලයින් ආදි වශයෙන් මූලිකත්වයක් ගෙන කටයුතු කිරීම බොහෝ රටවල දක්නට ලැබෙන ලක්ෂණයකි. එමෙන් ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීමට කටයුතු කිරීමේදී විවිධ ආකාරයෙන් දායක වී ඇති අතර, ඒ නිසා විවිධ සේවාවන්ද ඇතිවින.

ග්‍රන්ථ නාමාවලි අනුක්‍රමණිකා, සාර සංග්‍රහ, ජාතික ඒකාබද්ධ සූචිය, ඒකාබද්ධ සූචි, ඒකාබද්ධ ලැයිස්තු, ග්‍රන්ථ නාමාවලී පිළිබඳ ග්‍රන්ථ නාමාවලී සම්පාදනය, පරිගණක ග්‍රන්ථ විඥාපන දත්ත පදනම්, ප්‍රතිග්‍රහණ ලැයිස්තු සහ වෙළඳ ග්‍රන්ථ නාමාවලී ආදිය මගින් ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇතිකිරීමට කටයුතු කරනු ලැබේ. මෙවා අතුරින් කාලීන සහ පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලී (Current and Retrospective Bibliographies), විෂය ග්‍රන්ථ නාමාවලී (Special Bibliographies), ක්ෂේත්‍ර ග්‍රන්ථ නාමාවලී, (Area Bibliographies) ආදිය, අනුක්‍රමණිකා (Indexes), සාර සංග්‍රහ (Abstracts), ජාතික ඒකාබද්ධ සූචිය (National Union Catalogue) ඒකාබද්ධ සූචි සහ ඒකාබද්ධ ලැයිස්තු ( Union Catalogues & Union Lists) වැනි ද්විතීයික ප්‍රලේඛන (Secondary Sources) මගින් ප්‍රාථමික මූලාශ්‍ර මොනවාද යන්න ඉතා පහසුවෙන් දැනගැනීමට හැකියාවක් ඇති කරනු ලබන අතර, එකී ප්‍රාථමික මූලාශ්‍ර කරා ඉතා පහසුවෙන් ප්‍රවේශ වීමට ද හැකියාවක් ඇති කරනු ලබයි. ඒකාබද්ධ සූචි හා ඒකාබද්ධ ලැයිස්තු

මගින් ග්‍රන්ථ විඥාපන තොරතුරු වලට අමතරව ප්‍රකාශනය ඇති පුස්තකාලය හෝ ආයතනය ද සඳහන් කෙරේ. ජාතික ඒකාබද්ධ සූචිය මගින් කිසියම් රටක ඇති පුස්තකාලයන්හි එකතුන් පිළිබඳ තොරතුරු එක් ප්‍රධාන පුස්තකාලයක ඒකරාශි කිරීම සිදුවේ. මේ මගින් කිසියම් ප්‍රකාශනයක් ඇත්තේ කුමන පුස්තකාලයන්හි ද යන්න පහසුවෙන් දැනගැනීමට හැකියාවක් ලැබේ.

පුස්තකාල විසින් සිය පුස්තකාලවලට අත්පත් කරගන්නා පොත්පත් පිළිබඳ තොරතුරු සියලුම පාඨකයන්ට දැනගැනීමට සැලැස්වීම සඳහා ප්‍රවර්තන සම්ප්‍රජානන සේවය යටතේ (Current Awareness Services) ප්‍රතිග්‍රහණ ලැයිස්තු (Acquistions Lists) සම්පාදනය, විටින් විට පුස්තකාලයට ලැබෙන අළුත් ම ප්‍රකාශන පිළිබඳව පුස්තකාලයට අළුතින් ලැබුණු දෑය (New Arrivals) යනුවෙන් ලැයිස්තු පිළියෙල කිරීම සිදු කෙරේ. පුස්තකාල තුළ ප්‍රකාශයට පත් කරනු ලබන මෙවැනි දෑය ද ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීමට උපකාරී වේ. වෙළඳාම සඳහා හෝ මිළදී ගැනීමේ පහසුව අරමුණු කොට ගෙන සම්පාදනය කරනු ලබන වෙළඳ ග්‍රන්ථනාමාවලී ද ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීමට කිසියම් ප්‍රමාණයකින් දායක වන බව කීමට පුළුවන.

කාලීන මෙන් ම පූර්වකාලීන සාහිත්‍ය පිළිබඳ ගවේෂණයක් කිරීමේ දී කුමන ද්විතියික ගනයේ මූලාශ්‍ර පරිශීලනය කළ යුතු ද ?, කිසියම් විශේෂිත විෂයක් සම්බන්ධයෙන් ඇති ග්‍රන්ථ නාමාවලී මොනවා ද ? කිසියම් වාර සඟරාවක පළ වී ඇති ලිපි සඳහා අනුක්‍රමණිකාවක් තිබේ ද ? කිසියම් සඟරාවක එක්තරා කලාපයක් ඇත්තේ කුමන පුස්තකාලයක ද? තරුණ අසහනය පිළිබඳ පුවත්පත්වල පළ වී ඇති ලිපි මොනාවා ද යන්න සොයාගන්නේ කෙසේ ද ? වැනි පර්යේෂකයන් හා අනිකුත් සියලුම පාඨකයන් විසින් අසනු ලබන විවිධ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පුස්තකාලයාධිපතීන්ට සිදුවේ. ප්‍රකාශයට පත්ව ඇති දෑය ගැන තොරතුරු පාඨකයන්ට ලබාදීමේ දී මනා ග්‍රන්ථ විඥාපන පාලනයක් තිබේනම් එම සේවාව කාර්යක්ෂමව ඉටු කිරීමට හැකියාවක් ලැබේ.

## වාර සඟරා පිළිබඳ ග්‍රන්ථ විඥාපන පාලනය

එකම ග්‍රන්ථ නාමයක් යටතේ, කිසියම් අනුපිළිවෙලකට, කලාප වශයෙන් වාරිකව පළවන, එහි අවසානය කවදා දැයි කිව නොහැකි හැඳින්වීමට පුළුවන. වාර සඟරා අළුත්ම දැනුම සංනිවේදනය කරන, අත්දැකීම් හුවමාරු කරගන්නා, අළුත් අදහස් ප්‍රචාරනය කරන වේදිකාවක් වැනිය. පුස්තකාලවලට අත්පත් කරගන්නා දෑය අතුරින් ඉතාම වැදගත් පුස්තකාල ද්‍රව්‍යයක් ලෙස වාර සඟරා ගැනේ. පොතකට වඩා ඉක්මණින් අළුත්ම තොරතුරු ලබාගත හැකි පහසු මාර්ගයක් වීමත්, ඉක්මනින් සඟරා ලිපියක් කියවා අදහස් ලබාගැනීමට හැකිවීමත්, වාර සඟරාවන්හි ලිපි සාධිකාරී බවින් යුතු වීමත්, විශිෂ්ඨ තොරතුරු ලබාගත හැකි වීමත් යනාදී කරුණු නිසා වාර සඟරා ප්‍රලේඛන මාධ්‍යයක් ලෙස වැදගත් වේ. පර්යේෂණ හෝ විශේෂ පුස්තකාල වාර සඟරා සඳහා විශේෂ අවධානයක් යොමු කෙරේ.

වාරසඟරා, ප්‍රාථමික, ද්විතීය සහ තෘතීය වශයෙන් මූලික කොටස්වලට බෙදා දැක්විය හැක. ලිපි ඇතුළත්ව ඇති සඟරා ප්‍රාථමික සඟරා වන අතර, එම ලිපි කියවීමෙන් යමකිසි දැනීමක් ලබාගැනීමට හැකියාවක් ඇති වේ. අනුක්‍රමණිකා සඟරා (Indexing Journals) සහ සාරාංශ සඟරා (Abstracting Journals) ද්විතීය සඟරා වන අතර, මේ මගින් ප්‍රාථමික සඟරාවල ඇති ලිපි මොනවා ද යන්න සොයා ගැනීමට මගපෙන්වීමක් කෙරේ. ද්විතීය සඟරා මුද්‍රිත මාධ්‍යයෙන් පමණක් නොව, විද්‍යුත් මාධ්‍යයෙන් එනම් ඩිස්කට් සහ සංගෘහිත තැටි (CD -ROM) වශයෙන් ද ඇත. තෘතිය ගනයට වැටෙන සඟරා වශයෙන් සමාලෝචන සඟරා (Review Journals) දැක්වීමට පුළුවන. කිසියම් සඟරාවක පළ වී ඇති ලිපි පිළිබඳ විවේචන මෙම සඟරා වර්ගයෙහි ඇතුළත් වේ.

## ග්‍රන්ථ විඥාපන පාලනයේ මූලික අංග

වාරසඟරා පිළිබඳ ග්‍රන්ථ විඥාපන පාලනය ගැන සලකා බලන විට එහි ප්‍රධාන අංශ දෙකක් ඇති බව පෙනීයන කරුණකි. එනම් බාහිර ග්‍රන්ථ විඥාපන පාලනය සහ අභ්‍යන්තර ග්‍රන්ථ විඥාපන පාලනයයි. බාහිර ග්‍රන්ථ විඥාපන පාලනය යටතේ ප්‍රකාශයට පත්ව ඇති වාරසඟරා මොනවා ද ? ඒවායේ අන්තර්ගතය, එම වාරසඟරා ඇති පුස්තකාල මොනවා ද ? ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවා ඇති එහෙත් ඉල්ලුමක් ඇති වාරසඟරා මොනවා ද? කාලීන වාරසඟරා මොනවා ද ?, ඉදිරියේදී ප්‍රකාශයට පත්වීමට නියමිත වාර සඟරා මොනවාද යනාදී තොරතුරු සැපයීම සිදුවේ. බාහිර ග්‍රන්ථ විඥාපන පාලනයේ මූලික අංග වනුයේ ; (1) ග්‍රන්ථ විඥාපන විස්තරය, (2) වාරසඟරා පිළිබඳ ග්‍රන්ථ නාමාවලි - වාර සඟරා නාමාවලි (Directories) ඒකාබද්ධ වාරසඟරා ලැයිස්තු (Union List of Periodicals), වාරසඟරා අනුක්‍රමණිකා ලැයිස්තු, වාරසඟරා සාරාංශ ලැයිස්තු, පුස්තකාලවල ඇති සඟරා පිළිබඳ තොරතුරු ලැයිස්තු, පුස්තකාල සූචි (3) සඟරාවල අන්තර්ගතය පිළිබඳව විශ්ලේෂණය කරනු ලබන නියමු - අනුක්‍රමණිකා සේවා, සාර සංග්‍රහ සේවා, පටුන පිටු සේවය, ප්‍රවර්තන සම්ප්‍රජානන විවරණිකා (Current awareness

Bulletins) (4) පුස්තකාලවල ඇති සඟරා පිළිබඳ නියමු - ඒකාබද්ධ සූචි, ජාතික ඒකාබද්ධ සූචිය (5) වාර සඟරා ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි සහයෝගිතා වැඩසටහන් සංවිධානය කිරීම.

අභ්‍යන්තර ග්‍රන්ථ විඥාපන පාලනය යටතේ සඟරා හැකි පමණ අත්පත් කර ගැනීම, ඒවා ප්‍රදර්ශනය කිරීම, වාරසඟරා උපරිම මට්ටමකින් ප්‍රයෝජනයට ගැනීම සඳහා පුස්තකාල විසින් වාරසඟරා සූචිකරණය, වාරසඟරා ලැයිස්තු පිළියෙළ කිරීම, වාරසඟරා සංසරණය ආදී ක්‍රම යොදා ගැනීම සිදුවේ.

ශ්‍රී ලංකාවේ වාර සඟරා පිළිබඳ කාලීන විඥාපන පාලනය මෙන්ම පූර්වකාලීන ග්‍රන්ථ විඥාපන පාලනය සඳහා ජාතික ආයතන, විවිධ වර්ගවලට අයත් පුස්තකාල, තනි පුද්ගලයින්, පුස්තකාල ජාල ආදී වශයෙන් විවිධ ආකාරයෙන් කටයුතු කර ඇති බවත්, කටයුතු කරගෙන යමින් පවතින් බවත් සඳහන් කිරීමට පුළුවන. ප්‍රකාශයට පත්ව ඇති වාරසඟරා මොනවාද යන්න ගැනත්, වාර සඟරාවන්හි ඇති ලිපි පිළිබඳවත්, ද්විතීයික වාරසඟරා සම්බන්ධයෙන් ඇති විද්‍යුත් මාධ්‍යයේ ප්‍රකාශන පිළිබඳවත් ලැයිස්තු, නාමාවලී අනුක්‍රමණිකා, සාරසංග්‍රහ, පුස්තකාල සූචි, ඒකාබද්ධ සූචි, ජාතික ඒකාබද්ධ සූචිය, පටුන පිටු විවරණිකා ආදිය සම්පාදනය මගින් ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීමට කටයුතු කරන බව පෙනී යන්නකි.

## කාලීන වාරසඟරා තොරතුරු - ග්‍රන්ථ නාමාවලී සහ නාමාවලී

ප්‍රමාණවත් ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීමට නම් ප්‍රකාශයට පත්ව ඇති වාරසඟරා නාම පිළිබඳව විස්තරාත්මක ග්‍රන්ථ විඥානාත්මක තොරතුරු ඇතුළත් ලැයිස්තු ප්‍රකාශයට පත් කළ යුතු වේ. 1963 දී සම්පාදනය කර ප්‍රකාශයට පත්කිරීම ආරම්භ කරන ලදී ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියෙහි (1963 - 1973 දක්වා සම්පාදනය කර ප්‍රකාශයට පත්කරන ලද්දේ ජාතික ලේඛනාරාක්ෂක දෙපාර්තමේන්තුව විසිනි.) (1974 - මේ දක්වා ප්‍රකාශයට පත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විසිනි) සෑම අළුත් වාර සඟරාවකම ප්‍රථම කලාපය පිළිබඳ සම්පූර්ණ ග්‍රන්ථ විඥානාත්මක තොරතුරු ඇතුළත් කිරීම සිදුවේ. එමෙන්ම වාරසඟරා නාමය වෙනස් කරනු ලැබූ අවස්ථාවලදී ද වෙනස් කරන ලද සඟරා නාමයෙහි ප්‍රථම කලාපය පිළිබඳව ද සම්පූර්ණ ග්‍රන්ථ විඥානාත්මක තොරතුරු ඇතුළත් කිරීම සිදු වේ.

නිදසුන : අධ්‍යාපන ප්‍රවර්ධන ක .- 1 (1996)
සංස්කරණය රාජා ගුණවර්ධන .- කොළඹ : ශ්‍රී ලංකා අධ්‍යාපන ප්‍රවර්ධන සංගමය,
1996 .- පි. 88;
සෙ. මී.22 මිළ නොදැක්වේ
(265158)

කාලීන ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියට ඇතුළත්වන පූර්ව ප්‍රකාශන ග්‍රන්ථ නාමාවලිය නැමැති කොටසින් ඉදිරියේ දී ප්‍රකාශයට පත්වීමට නියමිත වාරසඟරා පිළිබඳ සම්පූර්ණ ග්‍රන්ථ විඥානාත්මක තොරතුරු ඇතුළත් කිරීම සිදුවේ.

නිදසුන් : සේයාරු .- කා. 1, ක.1 (ජනවාරි, 1997)
සංස්කරණය කුමාරි එදිරිසූරිය
නුගේගොඩ : මයික්‍රො ප්‍රොසෙස්, 1997
ISSN 1391 - 2569:
රු 100.00
වාරික ප්‍රකාශන ලෙස ප්‍රකාශයට පත් වන රජයේ ප්‍රකාශනවල සියලුම කලාප පිළිබඳ ග්‍රන්ථ විඥානාත්මක තොරතුරු පිළිබඳ පාලනයක් ඇති කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විසින් ශ්‍රී ලංකා රජයේ ප්‍රකාශන නාමාවලිය සම්පාදනය කෙරේ. නිදසුන් : ශ්‍රී ලංකා සේවක සඟරාව - කම්කරු හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය, පෙරමඟ - නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය, නුවණ - අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය) 1990, 1991 - 1992 යන වර්ෂවලදී ප්‍රකාශයට පත්ව ඇති රජයේ ප්‍රකාශන ගනයට ගැනෙන වාරසඟරා පිළිබඳ ග්‍රන්ථ විඥානාත්මක තොරතුරු මෙම නාමාවලියෙහි ඇතුළත් වේ. මෙය අඛණ්ඩව ප්‍රකාශයට පත් කෙරෙන නාමාවලියක් වන අතර, 1993/ 1994 වසර සඳහා වන ප්‍රකාශනය දැනට සම්පාදනය කිරීමේ කටයුතු අවසන් වෙමින් පවතී.

ලංකාවේ මුද්‍රිත ග්‍රන්ථ පිළිබඳව නාමාවලිය නමින් ත්‍රෛමාසික ප්‍රකාශනයක් ලෙස ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි V කොටසෙහි පළවන ලැයිස්තුවෙහි නීතිමය තැන්පතුව යටතේ ලියාපදිංචි වන වාරසඟරාවල සියලුම කලාප ඇතුළත් වේ. එහෙත් මෙම ලැයිස්තුවෙහි වාරසඟරා පිළිබඳව සම්පූර්ණ ග්‍රන්ථ විඥානාත්මක තොරතුරු ඇතුළත් වීමක් සිදු නොවේ.

## පූර්වකාලීන වාරසඟරා තොරතුරු - ග්‍රන්ථ නාමාවලී සහ නාමාවලී

වාරසඟරා පිළිබඳව පූර්වකාලීන තොරතුරු සම්බන්ධයෙන් ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීම සඳහා විවිධ ආයතන හා පුද්ගලයින් විසින් අඛණ්ඩව කටයුතු කරගෙන යන බව සඳහන් කිරීම වැදගත් වේ.

ග්‍රන්ථ විඥාපන පාලනයක්

ඇති කිරීම සඳහා ප්‍රකාශයට පත්කර ඇති ප්‍රකාශනවලින් කිහිපයක් නිදසුන් ලෙස මෙහි පහත දැක්වේ. : 1962, 1734 - 1884 දක්වා කාලය තුළ දී ප්‍රකාශයට පත් වූ ප්‍රකාශන පිළිබඳව ග්‍රන්ථ විඥානාත්මක පාලනයක් ඇති කිරීමට ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විසින් පූර්වකාලීන ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ප්‍රකාශයට පත් කිරීමට 1991 දී ව්‍යාපෘතියක් දියත් කරන ලදී. මේ අනුව 1734 - 1884 දක්වා කාලපරිච්ඡේදය සඳහාත් 1962 වර්ෂය සඳහාත් පූර්වකාලීන ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කොට ප්‍රකාශයට පත් කර ඇත. මේ මගින් එම කාලපරිච්ඡේදයන්හි ප්‍රකාශයට පත් වාර සඟරා පිළිබඳව ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීමට උත්සාහ දරා ඇත. 1885 සිට 1961 දක්වා කාලපරිච්ඡේදය සඳහා ප්‍රකාශයට පත්ව ඇති ප්‍රකාශන පිළිබඳ තොරතුරු ඇතුළත් පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කළයුතුව ඇත.

ජාතික කෞතුකාගාර පුස්තකාලයට ලැබුණු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි වාරසඟරා පිළිබඳ විස්තර ඇතුළත් කොට කොටස් තුනකින් යුතුව වාර සඟරා නාමාවලියක් සම්පාදනය කොට 1971 දී ප්‍රකාශයට පත්කරනු ලැබ ඇත. Ceylon Periodicals Directory නැමැති මෙම නාමාවලිය පූර්වකාලීන වාර සඟරා තොරතුරු පාලනය සඳහා වන වැදගත් මූලාශ්‍රයක් බව සඳහන් කල හැක. කළුකොඳයාවේ පඤ්ඤාසේකර මහ නායක ස්වාමීන්වහන්සේ විසින් කොළඹ ජාතික කෞතුකාගාර පුස්තකාලයට පරිත්‍යාග කරන ලද ඉංග්‍රීසි වාර සඟරා පිළිබඳ ලැයිස්තුවක් ජාතික කෞතුකාගාර පුස්තකාලය විසින් 1975 දී ප්‍රකාශයට පත් කර ඇත.

ජාතික විද්‍යා සභාව යටතේ ප්‍රකාශයට පත්කර ඇති ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ සඟරා සහ සමාජ විද්‍යා සඟරා 50ක් පිළිබඳ විස්තර ඇතුළත් Sri Lanka Scientific and Technical Periodicals Directory පූර්වකාලීන වාරසඟරා තොරතුරු පාලනය සම්බන්ධයෙන් ඇති තවත් වැදගත් මූලාශ්‍රයකි. මෙය ප්‍රථම වරට 1976 දී ප්‍රකාශයට පත් කර ඇත. ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය මගින් 1953 දී ප්‍රකාශයට පත්කර ඇති එම්. යූ. එස්. සුල්තාන් බාවා මහතා විසින් සම්පාදිත List of Scientific Periodicals in the Libraries of Ceylon නමැති මූලාශ්‍රය ද පූර්වකාලීන සඟරා පිළිබඳව ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීමට උපකාරී වී ඇත.

## ඒකාබද්ධ වාර සඟරා ලැයිස්තු (Union Lists of Periodicals)

වාරික ප්‍රකාශනවල, විශේෂයෙන් ම විදේශීය වාරික ප්‍රකාශන වල මිල අධික වීමත්, ද්විතීයික වාර සඟරාවල මිල ඉතා අධික ලෙස ඉහල යාමත් හේතුවෙන් ජාතික මට්ටමින් වාර සඟරා ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි සම්පත් බෙදා හදා ගැනීමේ සහයෝගීතා වැඩසටහන් සංවිධානය කිරීම පුස්තකාල අතරේ සිදුවින. මේ අනුව විවිධ විෂය ක්ෂේත්‍රයන්ට අයත් පුස්තකාල විසින් පුස්තකාල ජාල ඇති කරගන්නා ලද අතර, පුස්තකාලවලට අත්පත් කරගනු ලබන වාර සඟරා පිළිබඳව ඒකාබද්ධ වාර සඟරා ලැයිස්තු සම්පාදනය කිරීම සිදුවේ. විෂයයන් අනුව ප්‍රකාශයට පත්ව ඇති වාර සඟරා පිළිබඳව ලැයිස්තු සම්පාදනය කිරීම ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීමට බොහෝ සෙයින් පිටුවහලක් වී ඇත. ඒකාබද්ධ වාර සඟරා ලැයිස්තු මගින් සඟරාවල ග්‍රන්ථ විඥානාත්මක තොරතුරුවලට අමතර වාර සඟරාව ඇති පුස්තකාලය කුමක් ද යන්න පෙන්නුම් කරන නිසා වඩාත් කාර්යක්ෂම සේවාවක් පර්යේෂකයන්ට මෙන් ම අනිකුත් පාඨකයන් හට ලබාදීමට හැකිවන අතර, අන්තර් පුස්තකාල බැහැරදීම වලදී ද පහසුවක් ඇති වේ.

වාර සඟරා පිළිබඳ ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇතිකිරීමට සඳහා ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ වාර සඟරා ලැයිස්තු සම්පාදනය කර ඇති අතර, කාලීනව සම්පාදනය කරගෙන යමින් පවතී. මෙහිදී නිදසුනක් වශයෙන් ඉන් කිහිපයක් පහත දැක්වේ.

### විද්‍යා හා තාක්ෂණය

(1) A union List of Scientific periodicals in Ceylon / com piled by M.A.P. Senadeera.- National Sci ence Council, 1971

(II) Union List of Scientific and Technical periodicals in Sri Lanka Libraries .- National Science Council, SLSTIC, 1980 (පුස්තකාල 52 ක වාර සඟරා පිළිබඳ විස්තර ඇත)

### සමාජ විද්‍යාව හා මානව විද්‍යාව

A Union List of School Science and Humanities Journals in Sri Lanka libraries.- National Science Council 1979

### ආර්ථික හා සමාජ සංවර්ධනය

ULIST - Union List of Economic and Social Development Periodicals in Sri Lanka Libraries .- Centre for Development Information, 1982

(පුස්තකාල 38 ක වාර සඟරා එකතුන් පිළිබඳ තොරතුරු ඇතුළත් වේ)

## අධ්‍යාපනය

UNILIS: Union List of Serial .- National Institute of Education, 1999.

අධ්‍යාපන විෂයට අදාළ ප්‍රමුඛ පුස්තකාල 32 ක් විසින් මිළදී ගනු ලබන වාරික ප්‍රකාශන පිළිබඳ ග්‍රන්ථ විඥානාත්මක තොරතුරු ඇතුළත් වාර සඟරා ඒකාබද්ධ ලැයිස්තුවකි.

## පරිසරය

**UNILEP- Union List of Environmental Periodicals - Central Environ mental Authority Library, 1993**

## සෞඛ්‍ය විද්‍යාව

(1) List of current periodical titles in HELLIS (Sri Lanka) network libraries/ compiled by L.R. Amarakoon, National Institute of Health Sciences, 1984.

(II) Union List of Health Sci ence periodicals in HELLIS (Sri Lanka) net work libraries / compiled by Kumudini Ekaratne, University of Colombo, Medical Library, 1985

(III) Union list of Periodical holdings of health Science libraries in Sri Lanka/ Com piled by S.R. Korale, Univer sity of Colombo, Medical Library, 1988

Union list of current periodi cals in the University Libraries in Sri Lanka.

ඉහත සඳහන් කරනු ලැබූ ඒකාබද්ධ වාර සඟරා ලැයිස්තු බොහොමයක් කාලීනව පරිගණක දත්ත පදනම් ලෙස පවතී.

## වාර සඟරා ලිපි අනුක්‍රමණිකා (Index to Periodical Articles)

වාර සඟරාවන්හි පළ වී ඇති ලිපි මොනවා ද යන්න පිළිබඳව ග්‍රන්ථ විඥානාත්මක විස්තර ඇතුළත් කොට සම්පාදනය කරනු ලබන අනුක්‍රමණිකා මගින් ද වාර සඟරා පිළිබඳ ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීම සිදුවේ. පොදුවේ පළවන සියලුම සඟරාවල ලිපි පිළිබඳව අනුක්‍රමණිකා පිළියෙළ කිරීම සිදුවන අතර, කිසියම් සඟරාවක ප්‍රකාශයට පත්ව ඇති කලාපයන්හි පළ වී ඇති ලිපි පිළිබඳව ද අනුක්‍රමණිකා පිළියෙල කෙරේ.

ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත්වූ සිංහල හා ඉංග්‍රීසි වාර සඟරාවන්හි ලිපි සඳහා "ලංකා සඟරා ලිපි සූචිය" (Ceylon Periodicals Index) නමින් අනුක්‍රමණිකාවක් සම්පාදනය කර ප්‍රකාශයට පත් කිරීම 1969 දෙසැම්බර් මස සිදුවිනි. මෙය 1979 දී "ශ්‍රී ලංකා සඟරා ලිපි සූචිය" (Sri Lanka periodicals Index) නමින් ප්‍රකාශයට පත් විනි. 1989 සිට මෙය ප්‍රකාශයට පත්වීම නැවතිනි. සඟරා ලිපි පිළිබඳ ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීමට මෙබඳු ප්‍රකාශනයක ඇති වැදගත්කම මෙන් ම ජාතික කර්තව්‍යයක් ලෙස ද සලකා ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විසින් 1998 සිට ත්‍රෛමාසික ප්‍රකාශනයක් වශයෙන් ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර ඇත. මේ හැරුණු විට " පුස්තකාල ප්‍රවෘත්ති " නැමැති ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ත්‍රෛමාසික සඟරාව සඳහා 1973 සිට 1992 දක්වා මෙම සඟරාවේ කලාපවල පළ වූ සියලුම ලිපි සඳහා " පුස්තකාල ප්‍රවෘත්ති" සඟරා ලිපි අනුක්‍රමණිකාව (Index to Library News) මැයෙන් අනුක්‍රමණිකාවක් සම්පාදනය කොට එය පුස්තකාල ප්‍රවෘත්ති සඟරාවේ 14 වන වෙළුම 3 වන කලාපය/ 1993 ජූලි - සැප්තැම්බර් කලාපයෙහි ප්‍රකාශයට පත්කර ඇත.

බොහොමයක් වාර සඟරාවන්හි ලිපි සඳහා අනුක්‍රමණිකා සම්පාදනය කිරීම කර ඇති අතර, මනා ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීම සඳහා අඛණ්ඩව ප්‍රකාශයට පත්වන වාර සඟරා සඳහා අනුක්‍රමණිකා සම්පාදනය ද අඛණ්ඩව සිදුකළ යුතුව ඇත. නිදසුන් වශයෙන් අනුක්‍රමණිකා කිහිපයක් මෙහි දැක්වේ.

(1) An Index to the Ceylon journal of Medical Science (1949 - 1970) complied by M. Indrani Abeywardena.

(II) Index to Economic Review Vol. 1-6 comp. by People's Bank, Documentation Unit.

(III) Index of the Journal of the National Science Council of Sri Lanka Vol. 1-5 SLSTIC National Science Council.

(IV) Index to the Journal of the Royal Asiatic Society Ceylon Branch 1845 - 1945, (Comp. Lyn De Fonseka) 1946-1970, Former Series 1950 - 1970 (New Series) Comp. by Titus Devendra

(V) Loris a Journal of Ceylon Wildlife 1936 - 1966 comp. by Douglas Austin/ Loris Journal of the Ceylon Wild life and Nature Protection Society June 1976 - Decem ber 1981 Comp. by. S. Naguleswaran.

(VI)Cumulative Index to
Vidyodaya Journal of Arts, Science and letters comp. by A. P. G. Leelaratne, 1968-1972

වාර සඟරා ලිපි ඇතුළත්ව ඇති ඉතා වැදගත් ග්‍රන්ථ නාමාවලියක් වන ආචාර්ය එච්.ඒ. අයි. ගුණතිලක මහතාගේ "A Bibliography of Ceylon" නමැති වෙළුම් 05 කින් යුත් නාමාවලිය 16 වන ශතවර්ෂයේ සිට 1978 දක්වා ශ්‍රී ලංකාවේ ඉතිහාසය,සංස්කෘතිය හා සමාජය කරුණු අරභයා ලියවුණු සාහිත්‍ය පිළිබඳ නියමු ග්‍රන්ථයක් ලෙස සැලකිය හැක. ප්‍රධාන වශයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සහ බටහිර භාෂාවලින් ලියැවුණු වාර සඟරා ලිපි මෙහි ඇතුළත් වේ. සඟරා ලිපිවල ග්‍රන්ථ විඥානාත්මක තොරතුරුවලට අමතරව සාරාංශ දැක්වීම ද කර ඇත. සවිස්තරාත්මක විස්තර දැක්වීමක් කර ඇති මෙම ග්‍රන්ථනාමාවලිය මගින් පූර්වකාලීන වාර සඟරා විඥාපන පාලනයක් ඇති කිරීමට මහත්සේ පිටුවහලක් වී ඇත. මීට අමතරව වාර සඟරා ලිපි ඇතුළත් ග්‍රන්ථනාමාවලිවලට නිදසුන් ලෙස ආචාර්ය ගුණතිලක මහතා විසින් සම්පාදිත The art and architecture of Ceylon සහ The April 1971 insurrection in Ceylon: a select Bibliography දැක්විය හැක.

අනුක්‍රමණිකාවලට අමතරව විවිධ විෂයන්ට අදාළ වාර සඟරා ලිපි පිළිබඳ ග්‍රන්ථ විඥානාත්මක විස්තර බොහෝ පුස්තකාලවල ඇති පරිගණක දත්ත පදනම්වලට ඇතුළත් වේ. නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

නිද :- GPL Periodical Articles -
Centre for Development Information IMIN data base - Periodical Articles International Irrigation Management Institute

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ මධ්‍ය පරීක්ෂණයේ එක් අවශ්‍යතාවක් ,වශයෙන් ශිෂ්‍යයන් විසින් වාර සඟරා ලිපි සඳහා සෑහෙන සංඛ්‍යාවක් අනුක්‍රමණිකා සම්පාදනය කර ඇත. මේ මගින් සඟරා ලිපි සඳහා අඛණ්ඩව අනුක්‍රමණිකා සම්පාදනය නොවී තිබුණේ නම් එම අඩුව මගහරවා ගැනීමට යම් ප්‍රමාණයකින් දායක වී ඇතැයි සිතිය හැක. 1997 වර්ෂය දක්වා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සිසුන් විසින් සම්පාදිත සිංහල හා ඉංග්‍රීසි වාර සඟරා ලිපි අනුක්‍රමණිකා සංඛ්‍යාව 72ක් පමණ වේ.

## පටුන පිටු විවරණිකා (Contents Page Bulletin)

වාර සඟරාවන්හි කලාපවල පළ වී ඇති ලිපි මොනවා ද යන්න පාඨකයන්ට දැන ගැනීමට සැලැස්වීම සඳහා ප්‍රවර්තන සම්ප්‍රජානන සේවාව යටතේ (Current Awareness Service) වාර සඟරාවල පටුන පිටුව ඡායා පිටපත් කොට පාඨකයන්ට ලබාදීම පුස්තකාල මගින් සිදු කෙරේ. එක් එක් විෂය කේන්ද්‍රයට අදාළව පළවන සඟරා සම්බන්ධයෙන් මෙලෙස පටුන පිටු ඡායා පිටපත් කොට සඟරා නාමය අකාරාදිව පිළියෙල කොට විවරණිකා ලෙස ප්‍රකාශයට පත්කිරීම පුස්තකාල මගින් සිදුකරනු ලැබේ. මෙය සඟරා ලිපි පිළිබඳව ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීමට උපකාරී වේ. නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

Current Contents in ENLINET, IIMI Library contents Page Bulletin, Current Contents - Journals received IDB.

(ඉතිරි කොටස ඊළඟ කලාපයේ)

19 පිටුවෙන්

ප්‍රවිශ්ට වුවහොත් එය පුදුමයට කරුණක් නොවේ. සාම්ප්‍රදායික මුද්‍රණ සාහිත්‍ය වෙත මහත් අභියෝගයක් අධිලේඛනය විසින් එල්ල කොට තිබුණ ද මුද්‍රිත සාහිත්‍ය භාවිතයෙන් ඉවත් කිරීමට මේ කිසිදු ක්‍රමයක් සමත් නොවනු ඇත. ඇත්ත වශයෙන් ම සිදුවනු ඇත්තේ මෙම නව ශිල්පීය ක්‍රම මුද්‍රිත සාහිත්‍යයන්ට අතිරේක වශයෙන් අපගේ සුවිශේෂ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක වීම පමණකි.

පළවූ අළුත්ම පොත පත

පිළිබඳ නිවැරදි තොරතුරු ලබා ගැනීමට

බලන්න ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය

# ලේඛන කලාවේ නව අභියෝගය: අධිලේඛන කලාව

ධනපාල ගුණසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ

ඇමෙරිකාවේ පළ වූ ඇට්ලැන්ටික් මන්ත්ලි (Atlantic Monthly) සඟරාවේ 1945 ජූලි කලාපයේ "අපට සිතෙන හැටි" (As we may think) යන මැයෙන් ලිපියක් පළවිය. එහි කතුවරයා වූයේ එවක අමෙරිකානු ජනාධිපති රූස්වෙල්ට් ගේ විද්‍යා උපදේශකයෙකු වූ වැන් එවර් බුෂ්ය. බුෂ් විසින් රචිත එම ලිපිය ලේඛන කලාවට නව අභියෝගයක් එල්ල කරාවි යයි ඔහු විසින් පවා සිහිනයකින්වත් නොසිතන්නට ඇත. එහෙත් තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ නියැලි විද්වතුන්ගේ චින්තනය නිසැකයෙන් ම නව ලේඛන කලාවක් කෙරෙහි යොමු කරලීමට එම ලිපිය සමත් විය. ඇත්ත වශයෙන්ම එය නව සංස්කෘතියක අරුණෝදය සටහන් කළේය.

ඉහත කී ලිපිය මගින් විශ්ව මට්ටමේ පුස්තකාල පද්ධතියක් ගොඩ නැගීමේ අවශ්‍යතාව අවධාරණය කළ බුෂ් ඒ සඳහා යොදාගත හැකි ක්‍රමවේදයක් ද යෝජනා කළේය. මෙම ක්‍රමවේද ය ඔහු හඳින්වූයේ "මතකයේ දිගුවක්" (Memory Extenion) යන අරුත දෙන මෙමෙක්ස් (MemEx) යන කෙටි යෙදුමෙනි. මෙමෙක්ස් යන්නෙන් ඔහු අදහස් කළේ පාඨකයාට හෝ ලේඛකයාට අභිමත පරිදි ක්ෂණිකව සංස්කරණය කිරීමට පහසුකම් ඇති පරිගණකය පදනම් කොටගත් මාර්ගගත ලේඛන හා චිත්‍ර පද්ධතියකි. බුෂ් යෝජනා කළ මෙමෙක්ස් ක්‍රමය එපරිද්දෙන් ම ක්‍රියාත්මක නොවූව ද එම සංකල්පය තාක්ෂණය කෙතෙහි වපුට සරු බීජයක් වූ බව නම් නිසැකය.

